සියලු ම හිමිකම් ඇවිරිණි]
(முழுப் பதிப்புரிமையுடையது)
All Rights Reserved]

16314

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1996 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 1996 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 1996

**ව්‍යවහාරික ගණිතය II**
**பிரயோக கணிதம் II**
**Applied Mathematics II**

| 02 | |
|---|---|
| S | II |

පැය තුනයි / மூன்று மணி / *Three hours*

ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

---

අවශ්‍ය තැන්හි ගුරුත්වජ ත්වරණය, $g = 10\ \text{m s}^{-2}$ ලෙස ගන්න.

1. (අ) $(y^2 + 1)(x + 2)\dfrac{dy}{dx} = y\,(y^2 + 3)$

අවකල සමීකරණය විසඳන්න.

(ආ) $u$ යනු $x$ හි ශ්‍රිතයක් විට, $u = x + 2y$ ආදේශය භාවිත කර,

$$2\,\frac{dy}{dx} = \tan^2 (x + 2y)$$

අවකල සමීකරණය විසඳන්න.

(ඇ) මූල ලක්ෂ්‍යය හරහා යන කිසියම් වක්‍රයක් කෙසේ ද යත්, එම වක්‍රයට ස්පර්ශකයේ $(x, y)$ ස්පර්ශ ලක්ෂ්‍යයත් $x$ − අක්ෂයත් අතර කොටසෙහි දිග, ස්පර්ශකයේ $x$ − අන්තඃඛණ්ඩයට සමාන වන පරිදි ය. වක්‍රයේ සමීකරණය සොයා ජ්‍යාමිතික ලෙස එය විවරණය කරන්න.

2. පිළිවෙළින් $a$ හා $b$ දිගින් යුත් $A$ හා $B$ දුම්රිය දෙකක්, සෘජු, සමාන්තර දුම්රිය පීලි මත ගමන් කරයි. ආරම්භයේ දී ($t = 0$ මොහොතේ දී) $A$ හි ඉදිරිපස $B$ හි පිටුපසට යන්තම් පිටුපසින් තිබෙන අතර නිශ්චලතාවේ සිට එක්වර ම $A$ දුම්රිය $f$ ඒකාකාර ශීඝ්‍රතාවෙන් ද, $B$ දුම්රිය $f'\,(< f)$ ඒකාකාර ශීඝ්‍රතාවෙන් ද ත්වරණය වීමට පටන් ගනියි. $t = t_1$ මොහොතේ දී $A$ හි පිටුපස $B$ හි ඉදිරිපස යන්තම් පසු කරන විට, $A$ දුම්රිය එතෙක් ලබාගත් ප්‍රවේගය නියතව පවත්වා ගැනීම අරඹයි. $t = t_2$ මොහොතේ දී $B$ හි ඉදිරිපස යළිත් $A$ හි පිටුපස වෙත ළඟා වන විට දුම්රිය දෙකම, එනම් $A$ දුම්රිය $f'$ ඒකාකාර ශීඝ්‍රතාවෙන් ද $B$ දුම්රිය $f$ ඒකාකාර ශීඝ්‍රතාවෙන් ද මන්දනය වීමට ආරම්භ වෙයි. $B$ හා $A$ දුම්රිය දෙක පිළිවෙලින් $t = t_3$ මොහොතේ දී හා $t = t_4\ (> t_3)$ මොහොතේ දී නිශ්චලතාවට පැමිණෙයි. දුම්රිය දෙකේ චලිතය සඳහා ප්‍රවේග-කාල වක්‍රවල දළ සටහන් එකම රූප සටහනක අඳින්න.

ඒ නයින් හෝ අන් අයුරකින් හෝ

(i) $t_1^2 = \dfrac{2\,(a + b)}{f - f'}$,

(ii) $t_2 = \left(\dfrac{2f}{f'} - 1\right) t_1$,

(iii) $t_4 - t_3 = \dfrac{(f - f')^2}{ff'}\, t_1$

බව පෙන්වන්න.

තවද, ගමන අවසානයේ දී $B$ ට සාපේක්ෂව $A$ ගේ පිහිටීම, $t = t_1$ මොහොතේ දී පිහිටීමම වෙයි නම්,

$$\frac{f}{f'} = \frac{3 + \sqrt{5}}{2}$$

බව පෙන්වන්න.

[ අනෙක් පිට බලන්න.

3. $m$ ස්කන්ධයෙන් යුත් අංශුවක්, $u$ ප්‍රවේගයක් ඇතිව සිරස් ලෙස උඩු අතට ප්‍රක්ෂේපණය කැරෙන්නේ $mkv^2$ ප්‍රතිරෝධයක් සහිත මාධ්‍යයක් තුළ ය. මෙහි $v$ යනු ප්‍රවේගය ද $k$ යනු නියතයක් ද වේ. $0 < \alpha < \frac{\pi}{2}$ විට $k = g\left(\frac{\tan\alpha}{u}\right)^2$ ලෙස ගැනීමෙන්,

(i) අංශුව එළැඹෙන උපරිම උස $\frac{1}{k}\log_e \sec\alpha$ බවත්

(ii) අංශුව උපරිම උසට ළඟා වීමට ගන්නා කාලය $\frac{\alpha u}{g}\cot\alpha$ බවත්

(iii) අංශුව, එහි ප්‍රක්ෂේපණ ලක්ෂ්‍යය වෙත ආපසු ළඟා වන වේගය $u\cos\alpha$ බවත්

පෙන්වන්න.

4. ගුවන් යානයක, නිසල වාතයේ දී වේගය $u$ km h⁻¹ වෙයි. පෘථිවියට සාපේක්ෂව එහි ගමන් මග වන්නේ පාදයක් $d$ km දිග $ABCDEFA$ සවිධි ෂඩස්‍රයකි. $\overrightarrow{AB}$ දිශාවට $v$ km h⁻¹ ($v < u$) ප්‍රවේගයකින් හමන සතත ඒකාකාර සුළඟක් ඇත. ෂඩස්‍රයේ පාද හය ඔස්සේ වන ගමන් සියල්ල ම සඳහා ප්‍රවේග ත්‍රිකෝණ (හැකි නම් එකම රූප සටහනක) අඳින්න. ඉංග්‍රීසි අකුරුවල අනුපිළිවෙලින් දක්වෙන අතට ගමන් වාරයක් සම්පූර්ණ කිරීමට ගුවන් යානයට ගත වන මුළු කාලය, පැය

$$\frac{2d}{u^2 - v^2}\left[u + \sqrt{4u^2 - 3v^2}\right]$$

බව පෙන්වන්න.

සුළඟට සාපේක්ෂව ගුවන් යානයේ පෙත සංවෘත වක්‍රයක් ද? ඔබේ පිළිතුර සනාථ කරන්න.

5. වස්තුවක් නිශ්චලතාවේ සිට සරල රේඛාවක් ඔස්සේ චලනය වන්නේ, ගමන් කළ $x$ දුරෙහි ශ්‍රිතයක් වන $f(x)$ ත්වරණයක් සහිතව ය. $f(x)$ වක්‍රය යට ඇති වර්ගඵලය $A$ නම්, එම දුර ගමන් කිරීමේ දී වස්තුව විසින් ලබා ගන්නා $v$ වේගය, $v = \sqrt{2A}$ යන්නෙන් ලැබෙන බව පෙන්වන්න.

ස්කන්ධය 800 kg ක් වන මෝටර් රථයක් නිශ්චලතාවේ සිට ආරම්භ කර සෘජු සමතල පාරක් දිගේ චලනය වෙයි. රථය 400 N ක නියත ප්‍රතිරෝධයකට භාජනය වන අතර එන්ජිමේ ඇදිල්ල ගමන් කළ දුර සමග ඒකාකාර ලෙස වැඩි වන්නේ ආරම්භයේ දී 1200 N කින් පටන් ගෙන, මෝටර් රථය 150 m ක දුරක් ගමන් කළ විට 3600 N තෙක් වැඩි වන පරිද්දෙනි. ත්වරණ-දුර වක්‍රයේ දළ සටහන අඳින්න. ඒ නයින් හෝ අන් අයුරකින් හෝ 150 m ගමන් කළ පසු මෝටර් රථය ලබා ගන්නා වේගය ගණනය කරන්න.

එම තත්ත්ව යටතේ ම, තිරසට $\sin^{-1}\left(\frac{1}{20}\right)$ ක කෝණයකින් ආනත පාරක් දිගේ ඉහළට 150 m ක් ගමන් කිරීමේ දී රථය ලබා ගන්නා වේගය ද සොයන්න.

6. ජල පොම්පයක්, තත්පරයට ජලය 12 kg ක් 7·5 m උසකට ඔසවයි. ජලය පිට වන්නේ 10 m s⁻¹ ක වේගයක් ඇති දිය පිහිරක් ලෙස ය. එක් එක් තත්පරයේ දී ජලයට ලබා දෙන යාන්ත්‍රික ශක්තිය සොයන්න. ඒ නයින් පොම්පයෙන් නිපදවන සඵල ජවය 1·5 kW බව පෙන්වන්න.

තිරසට 30° ක කෝණයක් ඉහළින් වන දිශාවකට දිය පිහිර එල්ල කර තිබේ නම් ජලය නවත් කවර උසක් ලබා ගන්නේ දැයි සොයන්න.

දිය පිහිර එහි ඉහළ ම ලක්ෂ්‍යයේ දී සිරස් බිත්තියකට හරි කෙළින් ම වැදී එහි දී ජලයේ මුළු ගම්‍යතාවම හානි වෙයි. බිත්තිය මත යෙදෙන බලය ආසන්න වශයෙන් 104 N බව පෙන්වන්න.

7. ගම්‍යතා සංස්ථිති මූලධර්මය සහ ශක්ති සංස්ථිති මූලධර්මය ප්‍රකාශ කරන්න.

පිළිවෙළින් ස්කන්ධය $m$ ද $M$ ද වන $P$, $Q$ අංශු දෙකක්, ස්වාභාවික දිග $l$ ද මාපාංකය $\lambda$ ද වන ලුහු දුන්නක් මගින් ඈඳ, ඒවා $l$ දුරක පරතරයකින් පිහිටන සේ සුමට තිරස් මේසයක් මත තබා තිබේ. $P$ අංශුව $u$ ප්‍රවේගයෙන් $Q$ දෙසට ප්‍රක්ෂේපණය කැරෙයි. $t$ වේලාවේ දී $P$ අංශුව චලනය වූ දුර $x$ ලෙසත් දුන්නේ දිග $y$ ලෙසත් ගෙන ගම්‍යතා සමීකරණයත් ශක්ති සමීකරණයත් ලියා දක්වන්න. ඒ නයින් හෝ අන් අයුරකින් හෝ

(i) දුන්නේ විශාලතම සම්පීඩනය

$$\sqrt{\frac{l m M}{\lambda (m + M)}}\, u$$

බව පෙන්වා, මෙය සිදුවන අවස්ථාවේ දී ස්කන්ධ කේන්ද්‍රයට සාපේක්ෂව $P$ අංශුවේ ප්‍රවේගය සොයන්න;

(ii) දුන්න යළි එහි ස්වාභාවික දිග තෙක් ප්‍රසාරණය වූ විට $P$ ස්කන්ධයේත් $Q$ ස්කන්ධයේත් ප්‍රවේග පිළිවෙළින්

$$\left(\frac{m - M}{m + M}\right) u \quad ද \quad \frac{2mu}{m + M} \quad ද$$

බව පෙන්වන්න.

8. $M$ ස්කන්ධයෙන් ද තිරසට $\alpha$ කෝණයකින් ආනත උඩු මුහුණතකින් ද යුත් සුමට කුඤ්ඤයක් සුමට තිරස් මේසයක් මත නිසල ව තිබේ. සිරස් ලෙස වැටෙන $m$ ස්කන්ධයෙන් යුත් අංශුවක් කුඤ්ඤයේ උඩු මුහුණතෙහි වන $P$ ලක්ෂ්‍යයේ ගැටෙයි. ගැටුමට මොහොතකට පෙර අංශුවේ ප්‍රවේගය $u$ වෙයි. අංශුවත් කුඤ්ඤයත් අතර ප්‍රත්‍යාගති සංගුණකය $e$ නම් කුඤ්ඤය,

$$V = \frac{mu\,(1 + e)\sin\alpha\cos\alpha}{M + m\sin^2\alpha}$$

ප්‍රවේගයෙන් චලනය වීමට පටන් ගන්නා බව පෙන්වන්න. කුඤ්ඤයේ උඩු මුහුණත සෑහෙන තරම් දිග නම්, යළිත් එම මුහුණතේ ගැටීමට අංශුවට ගත වන කාලය සොයන්න. දෙ වැනි ගැටුමේ $Q$ ලක්ෂ්‍යය,

$$PQ = \frac{2e\,(1 + e)\,(M + m)\,u^2\sin\alpha}{(M + m\sin^2\alpha)\,g}$$

යන්නෙන් ලැබෙන බව අපෝහණය කරන්න.

9. $A$, $B$ හා $C$ යනු සමාන කුඩා ගෝල තුනකි. $2a$ දිගින් යුත් අප්‍රත්‍යාස්ථ තන්තුවක් මගින් $A$ හා $B$ ද සර්වසම තන්තුවක් මගින් $B$ හා $C$ ද සම්බන්ධ කර තිබේ. ඒවා සුමට තිරස් මේසයක් මත තබා ඇත්තේ, $A$ ත් $B$ ත් අතර $a$ දුරක පරතරයකුත් $B$ ත් $C$ ත් අතර ද $a$ දුරක පරතරයකුත් තිබෙන සේ $A$ හා $B$ ගේ කේන්ද්‍ර රේඛාවට ලම්බව $B$ හා $C$ ගේ කේන්ද්‍ර රේඛාව පිහිටන පරිද්දෙනි. $C$ ගෝලය $u$ ප්‍රවේගයෙන් $\overrightarrow{BC}$ දිශාවට ප්‍රක්ෂේපණය කැරෙයි. $AB$ තොබුරුල් වූ විගස $A$ ගෝලයේත් $C$ ගෝලයේත් වේගයන් නිර්ණය කරන්න. මේ මොහොතේ දී $B$ ගේ ප්‍රවේගය, $C$ හි ආරම්භක දිශාව සමඟ $\tan^{-1}\frac{\sqrt{3}}{5}$ කෝණයක් සාදන දිශාවකට $\frac{2\sqrt{7}u}{13}$ බව පෙන්වන්න.

තවද, චාලක ශක්තියේ භාගික හානිය, $BC$ තොබුරුල් වන විට $\frac{1}{2}$ ක් ද $AB$ තොබුරුල් වන විට $\frac{8}{13}$ ක් ද බව පෙන්වන්න.

[ අනෙක් පිට බලන්න.

10. ස්වාභාවික දිග $l$ ද ප්‍රත්‍යාස්ථතා මාපාංකය $\lambda$ ද වන ලුහු තන්තුවක එක් කෙළවරකට $m$ ස්කන්ධයෙන් යුත් $P$ අංශුවක් ඇඳ ඇති අතර එහි අනෙක් කෙළවර $O$ අචල ලක්ෂ්‍යයකට සවි කර තිබෙයි. $l$ දිගින් යුත් ලුහු අවිතන්‍ය තන්තුවක එක් කෙළවරකට ස්කන්ධය $m$ ම වූ $Q$ අංශුවක් ද අනෙක් කෙළවර $P$ ට ද ගැට ගසා ඇත. ආරම්භයේ දී, සිරස් සරල රේඛාවක $OPQ$ පිහිටන සේ ද $OQ$ හි මධ්‍ය ලක්ෂ්‍යය $P$ වන පරිදි $l$ ස්වාභාවික දිගක් $PO$ ට තිබෙන සේ ද පද්ධතිය නිශ්චලතාවේ තබා ඉක්බිති එය නිශ්චලතාවේ සිට මුදා හරිනු ලැබෙයි. $t$ වේලාවේ දී $OP$ දිග $l + x$ ය. $P$ අංශුවත් $Q$ අංශුවත් සඳහා චලිත සමීකරණ ලියා දක්වන්න. ඒ නයින්

$$\ddot{x} + \omega^2\left(x - \frac{g}{\omega^2}\right) = 0$$

බව පෙන්වන්න. මෙහි $\omega^2 = \dfrac{\lambda}{2ml}$.

$t$ වේලාවේ දී $P$ අංශුවේ පිහිටීම, $x = \dfrac{g}{\omega^2} + A\cos\omega t + B\sin\omega t$

යන්නෙන් දෙනු ලැබෙයි නම්, $A$ හා $B$ නියතවල අගයයන් නිර්ණය කරන්න.

ඒ නයින් (i) පසුව එළැඹෙන චලිතයේ දී $OP$ තන්තුවේ දිග කිසි විටෙක $l$ ට අඩු නොවන බව ද

(ii) $PQ$ තන්තුවේ ආතතිය $2mg\sin^2\dfrac{\omega t}{2}$ බව ද

පෙන්වන්න.

ප්‍රත්‍යාස්ථ තන්තුවේ උපරිම විතතිය $2l$ නම් $\lambda$ හි අගය සොයා පළමු වැනි වරට උපරිම විතතිය ලබා ගන්නා වේලාව $\pi\sqrt{\dfrac{l}{g}}$ බවත් පෙන්වන්න.

11. $m$ ස්කන්ධයෙන් යුත් කුඩා $P$ මුදුවකට, සිරස් තලයක සවි කර තිබෙන කේන්ද්‍රය $O$ ද අරය $a$ ද වන සුමට වෘත්තාකාර කම්බියක සර්පණය වීමට නිදහස ඇත. කම්බියේ ඉහළම $A$ ලක්ෂ්‍යයට මුදුව ඇඳ ඇත්තේ ස්වාභාවික දිග $a$ ද ප්‍රත්‍යාස්ථතා මාපාංකය $mg$ ද වන ලුහු ප්‍රත්‍යාස්ථ තන්තුවක් මගිනි. මුදුව, කම්බියේ පහළම $B$ ලක්ෂ්‍යයේ තබා කම්බියට ස්පර්ශක දිශාවකට $u$ $(> \sqrt{2ga})$ තිරස් ප්‍රවේගයක් එයට දෙනු ලැබෙයි. $t$ වේලාවේ දී $\widehat{BOP} = \theta$ ලෙස ගෙන ස්පර්ශක දිශාව ඔස්සේ අංශුව සඳහා චලිත සමීකරණය ලියා දක්වන්න.

ඒ නයින් හෝ අන් අයුරකින් හෝ $0 \le \theta \le \dfrac{2\pi}{3}$ විට

$$a^2\dot{\theta}^2 = u^2 - 4ga\left(1 - \cos\frac{\theta}{2}\right)$$

බව පෙන්වන්න.

තවද, $u \le \sqrt{3ga}$ වෙයි නම්, මුදුව ක්ෂණික නිශ්චලතාවට පත් වන්නේ $OP$ රේඛාව උඩු සිරස සමඟ $\cos^{-1}\left(\dfrac{u^2 - ga}{2ga}\right)$ කෝණයක් සාදමින් බවත් පෙන්වන්න.

12. ස්කන්ධය $M$ ද අරය $a$ ද වන ඒකාකාර වෘත්ත තැටියක, එහි තලයට ලම්බ තැටියේ කේන්ද්‍රය හරහා යන අක්ෂයක් වටා අවස්ථිති ඝූර්ණය $\dfrac{1}{2}Ma^2$ බව සාධනය කරන්න.

ඒකාකාර වෘත්ත තැටියක ආකාරයෙන් ඇති ස්කන්ධය $M$ ද අරය $a$ ද වන කප්පියක් වටා යන $l$ දිගැති ලුහු අවිතන්‍ය තන්තුවක දෙකෙළවරට $m$ සහ $m'(< m)$ ස්කන්ධ ඇඳ තිබෙයි. කප්පියේ අක්ෂය තිරස් වන අතර එය ඝර්ෂණය නොමැති ව භ්‍රමණය වෙයි. තන්තුව ලිස්සීම වැළැක්වීමට ප්‍රමාණවත් තරම් කප්පිය රළු ය. ආරම්භයේ දී ස්කන්ධ සිරස් ලෙස එල්ලෙයි. ස්කන්ධ නිශ්චලතාවේ සිට මුදා හළ විට, කප්පියේ කෝණික ත්වරණය

$$\frac{2(m - m')g}{a(M + 2m + 2m')}$$

බව සාධනය කරන්න. තන්තුවේ කොටස් දෙකෙහි ආතතිවල අනුපාතය සොයන්න.

ආරම්භයේ දී, $m$ ස්කන්ධය, තැටියේ තිරස් විෂ්කම්භයේ එක කෙළවරක් ස්පර්ශ වෙමින් තිබෙයි නම්, මෙම චලිතය පවතින්නේ

$$\sqrt{\frac{(l - \pi a)(M + 2m + 2m')}{(m - m')g}}$$

කාලයක් සඳහා බව ද සාධනය කරන්න.